# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

4 ශ්‍රේණිය -බුද්ධ ධර්මය- මාර්තු මාසය- 4 වන සතිය

සැකසුම :- බලංගොඩ අධ්‍යාපන කලාපය
ප්‍රාදේශීය ගුරු උපදේශක :- ටී. වී. විජයතිලක

<u>සුභාශිතය යහපත්ය</u> 23

<u>සමගිය උතුම් වේ</u> 24

01. දරුවනි සුභාෂිතය යනුවෙන් හදුන්වන්නේ යහපත් වචන, හොද වචන වලටයි. කවුරුත් ආසයි නේද? හොද වචන කතා කරන්න, හොද වචන වලට සවන් දෙන්න. එසේ නම් ඔබගේ මිතුරා හෝ මිතුරිය සමග දෙබසක් නිර්මාණය කරමු ද?

02. ඔබ කැමති හොද වචන 10 ක් ලියමුද?
(මේ සදහා 23 පාඩම කියවන්න )

03. එම පාඩමේ පුහුණුවට තිබෙන ගාථා පද දෙක මතකයෙන් කියන්න පුරුදු වෙන්න.

04. ඔබ පාසලේ දී සමගියෙන් කළ ක්‍රියාවක් මතක් කර ගන්න. එසේම මිනිසුන් පමණක් නොව සතුන්ද සමගියෙන් සිටීම නිසා පුදුම සහගත නිර්මාණ ඔබ දැක තිබෙනවා නේද? එසේ නම් අපට කළ නොහැකි දෙයක් මිහිපිට නැත.
ඔබ පාසලේදී යහළුවන් සමග එකතු වී කල ක්‍රියාවන් 5ක් ලියන්න පුලුවන් නේද?

**"හොදයි ආදරණීය දුවේ, පුතේ ඔයාලට තෙරුවන් සරණයි!"**